

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**


| 57 වන කාණ්ඩය | බු.ව. 2558 ඇසළ මස පුරපසළොස්වක ද<br>ක්‍රි.ව. 2014 ජුලි මස 12 වන ද | 03 වන කලබ |
|---|---|---|


# නිවැරැදි දම්සක සඳමු නො වී සැක



ඇසළ සඳේ රන් කිරණ ගලනවා
දම්සක් බණ මිහිරියට ඇසෙනවා
අහස පුරා බුදු රැස් විහිදෙනවා
ඇසළ අසිරියෙන් ලොව පිබිදෙනවා

බරණැස ඉසිපතනේ වූ මිගද
වැඩ හිඳ දම්සක් දම් කඳ විහිද
මැදුම් පිළිවෙතක් ලොව වෙත පහද
බුදු හිමියන් දෙසුවේ මේ පොහොද

පෙරළා යැවියැ’කි සිවු සස් දම් ඇති
රවුම් රෝදෙ ඇති කොන් පන්නා නැති
ගරාදි විසි හතරක අරැතක් ඇති
නිවැරැදි ‘දම්සක’ හඳ පුදනු යුති

- අනඳ



# ඇසළ පොහොය මේ තරම් වැදගත් ඇයි...?

ජර්මනියේ හැම්බර්ග් නුවර වජිරාරාම බෞද්ධ මධ්‍යස්ථානාධිපති
මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ත්‍රිපිටකාචාර්ය
**පූජ්‍ය තල්පාවිල කුසලඤාණ හිමිපාණන් විසිනි.**

පින්වත් දුවේ පුතේ,

වසරක් තුළ එළැඹෙන පොහොය අතරින් වැදගත් ම පොහොය තුන තමා වෙසක්, පොසොන් සහ ඇසළ කියන්නේ. බෝසත් උපත, සම්බුද්ධත්වය, පරිනිර්වාණය කියන තෙමඟුල සිදු වුණු වෙසක් පොහොයත්, ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන ආ පොසොන් පොහොයත් කියන පොහොය දෙක අපි පසුගිය මාස දෙකේ දී සැමැරුවා. අද එළැඹෙන්නේ ඇසළ පොහොය යි. ඇසළ පසළොස්වක පොහොය හඳුන්වන පාලි වචනය වන්නේ 'ආසාළ්හ පුණ්ණමී' යන්න යි.

සියලු දෙනාට වැදගත් වන, පොහොය දවස් පාලි, සංස්කෘත, සිංහල, බුරුම සහ තායි භාෂාවලින් හැඳින්වෙන නම් පහත වගුවෙහි දැක්වෙනවා. (විකිපීඩියා ඇසුරින්.)

| Sinhala<br>සිංහල | Pāli<br>පාලි | Sanskrit<br>සංස්කෘත | Burmese<br>බුරුම | Thai<br>තායි |
|---|---|---|---|---|
| Bak<br>බක් | Citta<br>Ñ;a; | Caitra<br>චෛත්‍ර | Tagu | Chittra (จิตร) |
| Vesak<br>වෙසක් | Visākha<br>úidL | Vaisākha<br>වෛසාඛ | Kason | Wisakha<br>(วิสาข) |

| | | | | |
|---|---|---|---|---|
| Poson<br>පොසොන් | Jeṭṭha<br>ජෙට්ඨ | Jyaiṣṭha<br>ජ්‍යෙෂ්ඨ | Nayon | Chettha (เชษฐ) |
| Æsala<br>ඇසළ | Āsāḷha<br>ආසාළ්හ | Āṣāḍha<br>ආෂාඪ | Waso | Asanha<br>(อาสาฬห) |
| Nikini<br>නිකිණි | Sāvaṇa<br>සාවණ | Śrāvaṇa<br>ශ්‍රාවණ | Wagaung | Sawana (สา<br>วน) |
| Binara<br>ìkr | Poṭṭhapāda<br>පොට්ඨපාද | Bhādrapada<br>භාද්‍රපද | Tawthalin | Phatthrabot<br>(ภัทรบท) |
| Wap<br>වප් | Assayuja<br>අස්සයුජ | Āśvina<br>ආශ්වින | Thadingyut | Atsawayut<br>(อัศวยุช) |
| Ill<br>ඉල් | Kattikā<br>කත්තිකා | Kārttika<br>කාර්තික | Tazaungmon | Kattika (กัตติกา) |
| Und-<br>huvap<br>උඳුවප් | Māgasira<br>මාගසිර | Mārgaśirṣa<br>මාර්ගශිර්ෂ | Nadaw | Mikkhasira<br>(มิคสิร) |
| Duruthu<br>ÿre;= | Phussa<br>ඵුස්ස | Pauṣa<br>පෞෂ | Pyatho | Putsa (ปุสส) |
| Navam<br>නවම් | Māgha<br>මාඝ | Māgha<br>මාඝ | Tabodwe | Makha (มาฆ) |
| Mædhin<br>මැදින් | Phagguṇa<br>ඵග්ගුණ | Phālguna<br>ඵාල්ගුන | Tabaung | Phakkhun<br>(ผัคคุณ) |

වෙසක්, පොසොන් පොහොය වගේ ම ඇසළ පොහොයත් ඉතා ම වැදගත් වන්නේ, මේ ලෝකයට ධර්මයේ ආලෝකය පහළ වුණු දවස වන්නේ ඇසළ පොහොය දා නිසා යි. බුදුරජාණන් වහන්සේ පහළ වුණත්, මේ ලෝකයට ධර්මය දේශනා නොකළා නම් දෙවි මිනිසුන් ධර්මය අවබෝධ කරන්නේ නැහැ. ඒ නිසා ඇසළ පොහෝ දා සිදු වුණු සිදුවීම, බුද්ධ ශාසන ඉතිහාසයේ අතිශය අනුස්මරණීය සිදුවීමක්. එවකට සත්‍ය ගවේෂකයන් වශයෙන් සිටි කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන් තමයි ගෞතම බුද්ධ ශාසනයේ පළමුවෙන් ම සත්‍යය අවබෝධ කරන්නට වාසනාවන්ත වුණේ.

දම්සක් පැවැතුම් සුතුර හෙවත් ධම්මචක්කප්පවත්තන සූත්‍රය තුළින්, දුක, දුකට හේතුව වන තෘෂ්ණාව, දුකින් මිදීම වන නිවන, දුකින් මිදෙන මඟ වන ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන චතුරාර්ය සත්‍යය අවබෝධ කරන ආකාරය තමයි විස්තර වන්නේ. එහි ඇතුළත් එක් විශේෂ කරුණක් වන්නේ, ඒ ඒ සත්‍යය අවබෝධ කළ යුතු ආකාර සතරක් පෙන්වා තිබීම යි. ඒ අනුවඃ

| | |
|---|---|
| දුක | - පිරිසිඳ දැනගත යුත්තක් |
| තෘෂ්ණාව | - ප්‍රහාණය කළ යුත්තක් |
| නිවන | - සාක්ෂාත් කළ යුත්තක් |
| නිවන් මඟ | - භාවිත කළ යුත්තක්. |

ධම්මචක්ක කියන්නේ ධර්ම චක්‍රය යි. ධර්මය නමැති රෝදය යි. එය පෙරළා යැවීම, 'පවත්තන' හෙවත් 'ප්‍රවර්තනය' කියා හඳුන්වනවා. බුදුරජාණන් වහන්සේ ධර්ම චක්‍රය පෙරළා යැව්වේ, නැවත කිසිවකුට ආපසු හරවා නොඑවිය හැකි පරිද්දෙනුයි. 'අප්පතිවත්තියං' කියන්නේ එය යි. එහි අදහස, 'මෙය මෙසේ යැ' යි කියා බුදුරජාණන් වහන්සේ දක්වූ දෙයක් 'එය එසේ නොවේ යැ' යි කිව හැකි මහණෙක්, බමුණෙක්, මිනිසෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක්, මාරයෙක් මේ මුළු ලෝක ධාතුවෙහි ම නැත යන්න යි.

දේශනය අවසානයේ දැක්වෙන තවත් විශේෂ දහම් කරුණක් වන්නේ, 'හට ගැනීමේ ස්වභාවයට අයත් සියලු දේ නැසී යාමේ ස්වභාවයට අයත් ය' යන්න යි. ධර්මය ඇසූ පස්වග තවුසන් අතරින් කොණ්ඩඤ්ඤ තාපසතුමා ප්‍රථම ධර්මාවබෝධය හෙවත් සෝවන් ඵලයට පත්වීම සිදුවුණු බවත්, ඒ නිමිත්තෙන් බුදුරජාණන් වහන්සේ, ''කොණ්ඩඤ්ඤ, ඔබ දැන ගත්තා, කොණ්ඩඤ්ඤ, ඔබ දැන ගත්තා'' යනුවෙන් උදානයක් ප්‍රකාශ කළ බවත්, ඒ හේතුවෙන් එතැන් පටන් කොණ්ඩඤ්ඤ හාමුදුරුවන් 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ' (ධර්මය දැන ගත් කොණ්ඩඤ්ඤ) නම් වූ බවත් ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි සඳහන් වෙනවා.

ලෝකයට දහම් ඇස පහළ කරවූ ප්‍රථම ධර්ම දේශනාව සිදු වීමට අමතර ව, ඇසළ පොහොය තවත් කාරණා රාශියක් නිසා අපට වැදගත් වෙනවා.

තුසිත දිව්‍ය ලෝකයේ වැඩ සිටි අප මහබෝසතාණන් වහන්සේ පස්මහ බැලුම් බලා මනුෂ්‍ය ලෝකයේ මහාමායා දේවීන් වහන්සේගේ කුසෙහි පිළිසිඳ ගැනීම සිදු වන්නේ ඇසළ පොහොය දවසක යි. සිදුහත් කුමරුන්ගේ පුත් රාහුල කුමරුවන් උපදින්නේත්, විසි නව වැනි වියට පත් සිදුහත් කුමරුන් සතර පෙර නිමිති දැකීමෙන් අනතුරු ව ගිහි ගෙයින් නික්මීම හෙවත් මහා අභිනිෂ්ක්‍රමණය සිදු වන්නේත් ඇසළ පුන් පොහෝ දිනයක රාත්‍රී යාමයේ දී යි. දම්සක් පැවැතුම් සුතුර දෙසීමෙන් අනතුරු ව, බුදුරජාණන් වහන්සේ සහ පස්වග මහණුන් වහන්සේලාගේ ප්‍රථම වස් විසීම බරණැස ඉසිපතන නම් වූ මිගදායෙහි දී සිදු වන්නේත් ඇසළ පොහොය දිනෙක යි.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් සත් වසකට පසුව තීර්ථකයන්ගේ මානය බිඳලීම සඳහා යමාමහ පෙළහර පාන්නේත් ඇසළ පුන් පෝ දිනෙක යි. යමාමහ පෙළහර හෙවත් යමක මහාප්‍රාතිහාර්යය පෑම යනු, බුදු සිරුරේ රෝම කූපයක් පාසා එක වර ගින්දරත්, ජලයත් පිට වන ආකාරයක්, බලා සිටින්නන්ට දර්ශනය කරවීම යි. ඒ යමාමහ පෙළහර පෑමෙන් පසුව බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොවට වැඩම කොට මාතෘ දිව්‍යරාජයා ඇතුළු දෙවියන්ට අභිධර්මය හෙවත් විජම් බණ දේශනා කරන ලදුයේත් ඇසළ පොහොය දිනෙක යි. මාතෘ දිව්‍යරාජයා යනු සිදුහත් කුමරුන්ගේ මව් වූ මහාමායා දේවිය යි. බුදුරජාණන් වහන්සේ සත් වන වස් කාලය ගත කරන්නේ තව්තිසා දෙව් ලොවෙහි යි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකට පසු ව, මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්, අජාසත් රජුගේ දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වතය පාමුළ තැනූ

මණ්ඩපයෙහි දී ප්‍රථම ධර්ම සංගායනාව සිදු කරන්නට වස් එළැඹ මූලික කටයුතු ආරම්භ කරන ලද්දේත් ඇසළ පොහොය දිනෙක යි. පොසොන් පෝ දිනෙක ලංකාවට බුදු දහම ගෙන ඒමෙන් පසු ව ලක්දිව තුළ සීමා මාලකයක් පළමුවෙන් සම්මත කිරීම සිදු වන්නේත්, අරිට්ඨ කුමරුන් ප්‍රධාන ලාංකිකයන් පනස් හය දෙනකු 'තුම්බුරු සීමා මාලකයෙහි දී' මහණ කරවීම හා උපසම්පදා කරවීම සිදු වූයෙත් ඇසළ පුන් පොහොය දවසක යි. එමෙන් ම දෙවනපෑතිස් රජතුමා අට සැට ලෙන් පිළියෙළ කරවා දෙසැටක් රහතන් වහන්සේලාට පූජා කිරීමත්, ඒ ලෙන් තුළ ලක්දිව ප්‍රථම වස් එළැඹීමත් සිදු වන්නේ ද ඇසළ පෝ දිනෙක යි. මුළු ලෝකයෙහි ම අතිශය පූජනීය ස්ථානයක් වන, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ ධාතුන් වහන්සේලාගෙන් අටෙන් එකක් පමණ තැන්පත් කරවන ලද රුවන්මැලි සෑ රදුන් තනන්නට බුද්ධ වර්ෂ 382 දී දුටුගැමුණු රජතුමා විසින් මුල් ගල් තැබීමේ මංගල්‍යය සිදු කරන ලද්දේත් ඇසළ පොහොය දවසක යි. වසරක් පාසා පැවැත්වෙන මහනුවර දළදා මාළිගාවේ ඇසළ පෙරහර ආරම්භ කෙරෙන්නේත් ඇසළ පොහොය දවසේ දී යි.

මෙබඳු ඓතිහාසික ශාසනික වැදගත්කම් රාශියකින් යුතු ඇසළ පොහොයෙන් එළැඹෙන වස්සාන සමය ගිහි පැවිදි බොහෝ දෙනෙක් ස්වකීය ආධ්‍යාත්මික ගුණයන් දියුණු කරගන්නා කාලයකි. භික්ෂූන් වහන්සේලා විහාරස්ථානවල වස් වසමින්, භාවනාවට මුල් තැන දෙමින් ධර්මාවබෝධය ලබන්නට වෙහෙසෙන අතරේ, ගිහි දායක පින්වතුන් උන් වහන්සේලාට සිව් පසයෙන් ඇප උපස්ථාන කරනවා පමණක් නො ව, තමන් ද ධර්මාවබෝධය ලබන්නට හැකිතාක් කාලය වෙන් කර ගැනීම වැදගත් වෙනවා. වැඩිපුර වෙහෙර විහාරස්ථාන ඇසුරු කරමින්, ධර්මය ශ්‍රවණය කිරීම හා සාකච්ඡා කිරීමත්, භාවනා කිරීමත් සඳහා වැඩි වශයෙන් කැප වෙමින් මේ වස්සාන සමය ජීවිතයට ආලෝකය උදා කරවන කාලයක් කර ගැනීමට කැප වෙමු.

ඔබ සැමට තෙරුවන්ගේ අනන්ත ආශීර්වාදය වේ වා !

03 වන කොටස

# වර්තමාන ලෝකයට බුදු දහම පහදා දෙන්නකු ගේ මතක සටහන්

අනගාරික ධර්මපාලතුමා විසිනි

(''ධර්මපාල ප්‍රතිරාවය'' කෘතියෙනි)



ඒ කාලයේ දී සංස්කෘත බෞද්ධ ධර්ම ග්‍රන්ථ මෙන් නො ව, බුදුන් වහන්සේත් උන් වහන්සේ ගේ ධර්මයත් පිළිබඳ ඉතා ම ප්‍රාමාණික විස්තර සඳහන් පාලි ධර්ම ග්‍රන්ථ ගැන එ තරම් දැනීමක් නොතිබුණේ ය. පැරණිතම පාලි සාහිත්‍ය කෘති ලියා ඇත්තේ පුස්කොළවල සිංහල භාෂාවෙනි. 1884 දී බ්ලැවැට්ස්කි මැතිනිය මේ සාහිත්‍යය

ඉගෙන ගැනීමට මා තරයේ පෙළඹවූවා ය. එ කල මුද්‍රණය කර නොතිබුණ ඒ පොත් තිබුණේ පුස්කොළ පොත් වශයෙනි. ඇය ගේ උපදේශයට පින් සිදු වන්නට මම මගේ විවේක වේලාවල දී කොළඹ දී ඒ සුන්දර පැරණි අත් පොත් පිටපත් අධ්‍යයනය කරන්නට පටන් ගතිමි. ඒ අකුරු කියවීම ඉතා දුෂ්කර වී ය. මෙ පරිද්දෙන් මම බෞද්ධ පෙළ පොත් ගැන දැනුමක් ඇති කර ගතිමි.

එ වක් පටන් ලන්ඩනයේ පාලි පොත් සමාගමේත් හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ අභාවප්‍රාප්ත හෙන්රි ක්ලාක් වොරන් ගේත් විශිෂ්ට වැඩ කටයුතු නිසා පාලි සාහිත්‍ය පරිවර්තන මඟින් ඉංග්‍රීසි පාඨකයන්ට ද කියවීමේ අවස්ථාව ලැබී ඇත. අමෙරිකාවෙහි ඒ ගැන උනන්දුවක් දක්වන්නට පාලි අත් පිටපත් පරීක්ෂා කර බැලීමට ද පුළුවන්කම ඇත. බුරුම අකුරෙන් ලියූ පොත් ගණනාවක් බ්‍රවුන් විශ්ව විද්‍යාලයෙහි තිබේ. බෞද්ධ පෙළ පොත් මුළු මනින් ම - එ නම් ත්‍රිපිටකය මුළු මනින් ම අමෙරිකානු පඬිවරුන්ට ලබා ගත හැකි ය. ස්වර්ගස්ථ වූ සියම් රජු ගේ පිය රජතුමා සිය රාජෝදයෙන් විසි පස් වන සංවත්සරයේ දී බුරුම අකුරෙන් මුද්‍රණය කරන ලද්ද වූ ද කාණ්ඩ තිස් නවයකින් සමන්විත වූ ද ත්‍රිපිටකයේ පූර්ණ ග්‍රන්ථ මාලාවක් හාවර්ඩ් විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කළේ ය. පඬිවරුන් කීප දෙනකුන් ගේ ආත්ම පරිත්‍යාගශීලී වූත් උදාර වූත් වැඩ කටයුතු නිසා, බුද්ධාගම බුද්ධිවාදී ව ද විද්‍යානුකූල ව ද අධ්‍යයනය කිරීමේ පදනමක් වශයෙන් පාලි භාෂාවෙහි ඇති වැදත් කම ගැන බටහිර දැන් පිබිදීමක් ඇති වී තිබේ.

බුදුන් වහන්සේ ගේ බුද්ධත්වය ලද ඉන්දියාවේ ශුද්ධ භූමිය වන බුද්ධගයාවට මම 1891 ජනවාරි මාසයේ දී

ගියෙමි. ඉන්දියානු තාපසවරුන් විසින් කරන්නා වූ උපවාස හා අත්තකිලමථානුයෝග සාවුරුද්දක් තිස්සේ පුහුණු කිරීමෙන් දුබල වූ සිරුරු ඇති ගෞතමයන් වහන්සේ බුද්ධගයාව පිටුපස වූ කඳුවලින් මෑතට වැඩිය සේක. මනසට වධ දීමෙන් අධ්‍යාත්මය පිරිසිදු නොවන බව උන් වහන්සේ වටහා ගෙන සිටි සේක. සිය ශ්‍රාවකයන් විසින් අත් හරිනු ලැබූ උන් වහන්සේ හුදෙකලාව, ගිනි ගෙන දැවෙන ඉන්දියාවට සෑම විට ම ක්ෂේම භූමියක් වූ සුන්දර වන රොදට පැමිණි සේක. ඥාණය හා නිදහස ලබා ගන්නා තුරු එහි ම වාඩි වී සිටීමේ අධිෂ්ඨානයෙන් යුතු ව, උන් වහන්සේ සුන්දර වූ ද පැතිරී ගිය ශාඛා පරිමණ්ඩලයෙන් යුතු වූ ද ඇසතු වෘක්ෂ මූලයෙහි බෝධි වෘක්ෂ මූලයෙහි හිඳ ගත් සේක. දීප්තිමත් ඉන්දියානු සඳ පහනින් ඒකාලෝක වූ ඒ රාත්‍රියේ දී ම උන් වහන්සේ බුද්ධත්වයට පත් වූ සේක.

බුද්ධගයාව පිහිටා ඇත්තේ බිහාරයේ ගයා නගරයට සැතපුම් හයක් දකුණෙනි. බුද්ධාගමේ ඒ අතිපරිශුද්ධ පුණ්‍ය භූමිය වෙත ගමන් කරන්නා වූ වන්දනා කරුවන් පසු කරමින්, නදී තීරය දිගේ වැටකේ හා තල් ගස් අතරින් ශුද්ධ භූමිය දිසාවට ගමන් කළ මගේ හදවත ආවේගවලින් පිරී ගියේ ය. ක්‍රිස්තියානීන්ට ශුද්ධ සොහොන යම් සේ ද, යුදෙවුවන්ට සියොනය යම් සේ ද, මහමදගමයිකයන්ට මක්කම යම් සේ ද, බෞද්ධයන්ට බුද්ධගයාව එසේ ම ය. ඇතැම් විටෙක ලෝකයේ කිසි ම ස්ථානයක් මේ තරම් කාලයක් මුළුල්ලේ, මේ තරම් ජන සංඛ්‍යාවක් විසින් මේ තරම් ගෞරව කරනු නොලබන්නට ඇත. ශත වර්ෂ විසි පහක කාලයක් තිස්සේ, ලංකාව, බුරුමය, සියම, චීනය,

ජපානය, කොරියාව, තුර්කිස්ථානය හා තිබ්බතය යන රටවලින් බෞද්ධයෝ බුදුන් වහන්සේ හිඳ ගෙන සිටි මේ ශුද්ධ වෘක්ෂය බැලීමට ආවෝ ය.

අවුරුදු එක් දහස් හත් සියයකට ආසන්න කාලයක් තුළ බුද්ධගයාව කාසාය වස්ත්‍ර ධාරී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගේ බාරයෙහි පැවතුණේ ය. මෙහි මුල් විහාරය ඉදිකරන ලද්දේ බුද්ධාගමට හැරීමෙන් පසු අශෝක මහාධිරාජයාණන් විසිනි. ඉන්දියාවේ බුද්ධාගම වැජඹෙමින් තිබුණ කාලයේ දී බුද්ධගයාව ශිෂ්‍ය භික්ෂූන් දස දහසක ගේ පමණ නිවාස ස්ථානය වී ය. දොළොස් වන ශත වර්ෂයේ අග භාගයේ දී මහමදගමික ආක්‍රමණිකයෝ සිද්ධස්ථාන විනාශ කොට, එහි වාසය කළ භික්ෂූන් වහන්සේලා ඝාතනය කර දැමූහ. ඒ වන විට ද බ්‍රාහ්මණයන් සිය ආගම් වධ හිංසා මඟින් ඉන්දියාවේ බුද්ධාගම පරිහානියට පත් කර තිබිණ. මුස්ලිම් ජයග්‍රාහකයෝ ඒ විනාශය සම්පූර්ණ කළහ. බුද්ධගයාව කෙමෙන් පිරිහෙන්නට පටන් ගත්තේ ය. අවසානයේ දී තැනින් තැන යමින් ජීවිතය ගත කළ ශිව ආගමේ හින්දු ෆකීර්ලා එහි අවුත් ලැගුම් ගෙන, කල් යෑමේ දී එහි අයිතිකරුවන් බවට පත් වූහ. 1884 දී සිද්ධස්ථානය ඉන්දීය රජය විසින් යළි තනවන ලදි. ඊට අවුරුදු හයකට පසු ව එහි පැමිණි නිළධාරීන්ට, කථා බස් කිරීමට බෞද්ධ නියෝජිතයකු එහි දී දකින්නට නොලැබුණෙන්, සිද්ධස්ථානය ඇතුළත කළමණාකාරිත්වය ඔවුහු ශෛව ෆකීර්ලාට බාර කොට, බාහිර අයිතිය තමන් වෙත තබා ගත්හ.

(මතු සම්බන්ධයි)



# ඔබ හොඳ දරුවෙකි

### පුෂ්පා ජයවර්ධන නැන්ද විසිනි

සමනළයගෙ පාට ගන්න
මල්වල නෙක සුවඳ ගන්න
සඳ කැන් සේ දිළී ඉන්න
හොඳ දරුවෙකු වී හැදෙන්න

සතුට සැමට බෙදා දෙන්න
කරුණා ගුණ පතුරුවන්න
දයා සිතින් මෙත් වඩන්න
හොඳ දරුවෙකු වී හැදෙන්න

ගුරු දෙගුරුන් නිති පුදන්න
කම්මැළි ගති දුරු කරන්න
පොත පත වෙත නෙත යොමන්න
හොඳ දරුවෙකු වී හැදෙන්න

කුරුලු ගීත රස විඳින්න
හිරි හැරයක් නොම කරන්න
සොබා දමේ සිරි විඳින්න
හොඳ දරුවෙකු වී හැදෙන්න

උදා ඉරක් සේ නැගෙන්න
සඳක් සේ ම සිසිල දෙන්න
රට ජාතිය බබළවන්න
හොඳ දරුවෙකු වී හැදෙන්න



# පදුම ජාතකය

**කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි.**

මහා කාරුණික බුදු පියාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටින කල එක් භික්ෂුන් වහන්සේ නමක් වෙනුවෙන් 'පදුම ජාතකය' දෙසූ සේක. ඒ උන්වහන්සේ ආනන්ද බෝධීන් වහන්සේ වෙනුවෙන් පවත්වන්නට යෙදුණු බෝධි පූජාවක් නිසාවෙනි.

ආනන්ද තෙරණුවන් රෝපණය කරන ලද ඇසතු බෝ රුක ආනන්ද බෝධීන් වහන්සේ ලෙස හඳුන්වන බව අපි කවුරුත් දනිමු. බුදු පියාණන් වහන්සේ මහා කරුණාවෙන් ලොව දෙස බලා අසරණයනට පිහිටවීමට වඩින කල, උන්වහන්සේ වෙනුවෙන් කරන පුද පූජා පැවැත්වූයේ ආනන්ද බෝධින් වහන්සේ උදෙසා ය.

උපාසක උපාසිකාවන් බෝධි පූජා සඳහා දෙව්රම් වෙහෙර අසල, මාලාකාර වීදියෙන් මල් මිලදී ගත්හ. මෙම භික්ෂුව ද ආනන්ද බෝධින් වහන්සේට බෝධි පූජා පැවැත්වීමට මල් විකුණන්නන් සිටින මාලාකාර වීදියට ගියහ. එහෙත් භික්ෂුවට, මල් ලබාගත නොහැකිව, එදින මාලාකාර වීදියේ මල් නොමැති බව ආනන්ද තෙරණුවනට දනුම් දුන්හ. ආනන්ද තෙරණුවෝ මාලාකාර වීදියට වැඩම කර, බෝධි පූජාවට මල් ගෙනයෑමට අවශ්‍ය බව, මල් විකුණන්නන්හට සැල කළහ. ඔවුහු උන්වහන්සේට මල් එකතුකර දුන්නෝ ය. ආනන්ද තෙරණුවන් මල් ලබාගත් අන්දම ගැන දම්සභාවේ එක් රැස්ව සිටි භික්ෂුහු කතිකා කරමින් සිටියහ. දම් සභාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මේ තතු දැනගෙන

නුවණැතිව ක්‍රියා කළහොත් තමන්හට නොවරදින බව පවසා අතීත කථාව වදාළ සේක.

පෙර බරණැස, බඹදත් රජතුමා පාලනය කළ සමයෙහි බෝසතාණන් වහන්සේ සිටු කුලයක උපන්නහ. අසලවූ සිටු මාළිග යේ මල් උයනෙහි සේවය කළ උයන්පල්ලා හට හොඳින් වැඩුණු නාසයක් නො තිබුණි. එය හරියට පෙනුණේ කපා ඇති සේ ය.

දිනෙක මල් ගෙනයෑමට සිටු මාළිගයට සිටු කුමරහු තිදෙනෙක් පැමිණියහ. එක් කුමරෙක් උයන්පල්ලා අමතා 'දැලි රැවුළ වැඩෙන ලෙස නාසය වැඩෙන්නට නම් මල් ගෙනත් දෙව''යයි කීවේ ය. උයන්පල්ලා එම කථාවට අසතුටුව මල් නොදුන්නේ ය. අනෙක් සිටු කුමරා මා හට මල් දුනහොත් කැපූ ගොයම නැවත වැඩෙන ලෙස නාසය වැඩෙනු ඇතැයි පැවසී ය. කෝපයට පත් උයන්පල්ලා ඔහුට ද මල් නොදුන්නේ ය. තුන්වැනි සිටු කුමරා ''මල් ඉල්ලීමට පැමිණි මේ කුමරුවන් පවසන්නේ මුසාවාදය. නාසය නැවත වැඩෙන්නේ නැති බව නොදන්නෙහි'දැයි උයන්පල්ලාගෙන් විමසූහ. මා පවසන්නේ සත්‍යය යි. එබැවින් මිතුර මා හට මල් දෙව යි කීහ. උයන්පල්ලා ''මේ කුමරු පවස්නේ සත්‍යය නොවේ දැ''යි සිතුවේ ය. එබැවින් මම මේ කුමරු හට මල් දිය යුතු යැයි සිතා මල් මිටියක් ම දුන්නේ ය. සිටු කුමරු මල් මිටිය තිදෙනා අතර බෙදා ගත්තේ ය. මේ අතීත කථාවයි.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා, තුන්වැනි සිටුකුමරු ලෙසින් නුවණින් කටයුතු කළ ආනන්ද තෙරණුවන් හට ද මල් ලබා ගැනීමට හැකි විණැයි වදාළහ.

නුවණින් විමසා බලා ඒ අවස්ථාවට කළ යුතු දේ කිව යුතු දේ හරියාකාරව කරන්නේ නම් පවසන්නේ නම් තමනට ජය ලබා ගත හැකි බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. මෙය අප ඉගෙන ගත යුතු පාඩමකි.

එකල සත්‍ය පවසා, මල් ලබා ගත් සිටුකුමරු තමන් වහන්සේ බව බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා වදාළ සේක.



# හඳයෝ නාඬන් ඉතින්......

අවුරුදු දෙකක් තිස්සේ
ඉස්කෝලෙ යන විට
අම්මා දීපු රුපියල් සතවලින්
ඔන්න මගේ කැටය පිරිලා !
පොසොන් සඳ උදා වෙන්න කලින්
ගේ මැද්දෙ කැටේ බිඳින කොට
මගේ හදවත ඉපිලුණා සතුටින්
රුපියල් විසි හතර දහසක් !
''මගෙ පුතා මොකද කරන්නෙ....
මේ සල්ලිවලින් ?''
''තාත්තෙ මං හිතාගෙන ඉන්නේ
ගවයෙක් නිදහස් කරන්න.....''
තාත්තා පොරොන්දු වුණා
ඉතිරි මුදල දෙන්නට
ගව ඝාතකාගාරයට යන විට
යම පල්ලෙකු වාගෙ මිනිහෙක්
මෙන්න එළදෙනක් ඇද ගෙන
යනවා.
එළදෙන දඟලනවා.
''අනේ මට මගේ පැටියා ලැබෙන
කල් වත් ඉන්න දෙන්න....''
උෟ කඳුළු සලමින්
එහෙම කිව්වා ද?

මට වාවන්න බැරි වුණා
මං දුවලා ගිහින්
කඹය අල්ලා ගත්තා
'මට මේ එළදෙන දෙන්න.....
මං මෙයා වෙනුවෙන්
සල්ලි ගෙවනවා.....''
පොසොන් පෝය ද
මහ නායක සමිඳුන් ඇතුළු
මහ සඟරුවන
පිරිත් සජ්ඣායනා කරද්දි
අපේ එළදෙන
පන්සල වත්තේ දී
නිදහස් කළා....
මට දැනුණා හරියට....
මං වීරයෙක් කියලා.....
සුපුන් සඳ පෑව්වා
පොසොන් සුවඳ දෝරෙ ගැලුවා
රාත්‍රී නවයට විතර ඇති....
එළ දෙනට පැටියෙක් ලැබුණා...
අප හැමෝ ම දිව්වා
පැටියා බලන්නට....
උෟ හඳයෙක් !

**කේ. ජී. නිසල් තාරුක**
මහරගම පමුණුව
ශ්‍රී ධර්මරක්ෂිත ධර්ම විද්‍යාලය - 11-2 ශ්‍රේණිය



# ප්‍රයෝජනයක් නැති ජීවිතය

**සෙන් කතාවක් ඇසුරිනි**

එක්තරා ගොවියෙක් කොතරම් වයස්ගත වූයේ ද කිවහොත් ඔහුට ගොවිපළේ තවදුරටත් වැඩපළ කිරීමට නොහැකි තත්ත්වයට පත්විය. මේ හේතුව නිසා ඔහු මුළු දවසම ගත කළේ පියස්ස අසල වාඩි වී සිටීමෙනි. ඔහුගේ පුත්‍රයා ගොවිපළේ ඉතා කඩිසර ලෙස වැඩපළවල යෙදුණු අතර වරින් වර බලද්දී පියා සිටියේ පියස්ස අසල වාඩි වී ය.

''ඔහුගෙන් තවත් කිසිම ප්‍රයෝජනයක් නැහැ. ඔහු කිසිම වැඩක් කරන්නෙත් නැහැ''යි තමාට ම කියාගත් පුතා වහා ම මිනීපෙට්ටියක් පියස්ස අසලට රැගෙන විත් එයට ඇතුළුවන ලෙස පියාට පැවැසී ය.

කිසිම වචනයක් පවා නොදෙඩූ පියා මිනීපෙට්ටිය තුළට වැදුණි. ඉන්පසුව ඒ පියන තදකොට වැසූ පුතා එම මිනීපෙට්ටිය තම ගොවිපළ කෙළවරේ තිබුණු උස් කඳු ප්‍රපාතයක් වෙත ගෙන ගියේ එය තල්ලුකර දැමීමට ය. මිනී පෙට්ටිය මෙසේ ප්‍රපාතයට හෙළීමට පුත්‍රයා විසින් ගෙනයද්දී පෙට්ටියේ පියනට තට්ටු කරන ශබ්දයක් ඔහුට ඇසුණි. එවිට ඔහු පියන ඇරියේ ය. ඉතා සාමකාමී ව තම

පියා එය තුළ වැතිරී සිටින අන්දම ඔහු දුටුවේ ය. පියා තම පුත්‍රයා දෙස හිස ඔසවා බැලී ය.

ඉන්පසුව තම පුත්‍රයා ඇමතූ පියා ''මම දන්නවා ඔබ මාව ගෙනියන්නේ අර ප්‍රපාතයෙන් පහළට හෙළීමට බව. නමුත් එසේ කිරීමට පෙර මම එක යෝජනාවක් ඉදිරිපත් කරන්නද? ඇසී ය. 'ඇයි ඒ මොකද්ද ?' පුත්‍රයා විමසී ය. ''ඔබ කැමති නම් මාව පමණක් මෙම ප්‍රපාතයට හෙළන්න. එසේ කර මේ වටිනා දැව මිනීපෙට්ටිය ආරක්ෂා කරගන්න. මෙය පාවිච්චි කරන්න ඔබේ දරුවන්ටත් අවස්ථාවක් උදාවේවි'' යැයි පැවැසී ය.

පරිවර්තනය : **එස්. කේ. ජේ.**

(දිවයින (2014.06.25) බදාදා අතිරේකයෙනි)

# අපේ පියවරු

දුරු බැහැරින් වත් දිවෙලක් සොයා යෙතී
මරු කතරින් වත් වෙහෙසී දන සොයතී
බොරු ගරු මන් හැරැ බැළ මෙහෙ වත් කෙරෙතී
මරු මුව වන් නමුදු දරුවන් සුව යොදතී

සාපවසින් මිරිකී දිවෙලෙහි යෙදෙතී
බෝ සුළුවෙන් යැපෙමින් දරුවන් වඩතී
මේ අයුරින් දිව රෑ පියවරු හිතැතී
දූ දරුවන් පිණිස ම හැම දුක් විඳිතී

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ**
**මහානායක මාහිමිපාණන් වහන්සේ**



# දෙමාපියන් ගේ සැබෑ සතුට

**විශ්‍රාමික ආචාර්යාණි**
**ලක්ෂ්මී කරුණානායක මහාත්මනිය විසිනි.**

''අම්මේ, අම්මේ''

''ඇයි පුතේ?''

''මම දන්නේ නැති තේරවිල්ලක් අහන්න තෝරා දෙනවා ද?''

''කෙනෙක් අත් පා වලින් පහර දෙයි. මුහුණටත් අනියි. එහෙම වුවත් ඔහු ප්‍රිය මනාප කෙනෙකි.

ඒ කවරෙක් ද?''

''පුතේ, නංගිට බඩගිනි වෙලා අඬනවා. නංගිගේ බඩ පුරවලා ම උත්තර දෙන්නම්. කෝ පුතාත් මෙතන වාඩි වෙලා නංගි කිරි බොන හැටි බලාගෙන ඉන්නකෝ.''

මවු තුරුලේ සිටි ළදරුවා කිරි බී බඩ පුරවාගෙන සතුටින් මෑණියන් සමඟ සෙල්ලම් කරයි. ලා දළු මෙන් මොළකැටි අත්වලින් මෑණියන්ට හිරිහැර කරයි. හිසකේ ඇද කඩයි. මෑණියන්ගේ මුහුණට මිටින් අනියි. ඒ විට ඈ ආදරයෙන් දරුවා තුරුළු කර ගනියි.

අම්මාත් නංගීත් දෙස බලා සිටි චූටි පුතා තම තේරවිල්ල ගැනත් සිතන්නට විය. ඔහුට සිනහවක් පහළ විය. අම්මේ, මම තේරවිල්ල දැනගත්තා.

''පුතේ, දැනගත් දේ කියන්න.''

''කුඩා දරුවා නේද?''

''හරියට හරි. මගේ පුතා පණ්ඩිතයෙක් නේ !'' කියමින් අම්මා පුතාගේ හිස සිප ගත්තා ය.

''පුතේ, මිනිසුන් පමණක් නොව සතුන් ද උන්ගේ දරුවන්ට ආදරෙයි. අර මඩුවේ බැඳ සිටින එළදෙනගෙන් පැටියා කිරි උරා බොන්නේත් බැළලියකගෙන් පැටවුන් කිරි උරා බොන්නේත් මවට හිරිහැර කරමිනි. උහුත් දරුවන් ලෙව කමින් සුරතල් කරති.

සෙල්ලම් කිරීම මවු තුරුලේ සිට කිරිබොන අවධියේ පටන් ම දරුවන් තුළ පවතින සහජ සිරිතකි. තම මවට ද හිරිහැර වන පරිදි අත් පා විසිකරමින් දරුවෝ සෙල්ලම් කරති. නොතේරෙන බිළිඳු වියේ දී පවා දරුවන් එසේ කරන්නේ ක්‍රීඩාව සෑම දරුවකුට ම වුවමනා දෙයක් නිසයි. තිරිසන් සතුන් පවා කුඩා වියේ දී සෙල්ලම් කරන බව අපි දනිමු.

ඉඳුරන් මුහුකුරා යමින් දරුවා වැඩෙන විට නගුලෙන් සෙල්ලම් කිරීම, ලී දඬුවලින් ගුඩු ගැසීම, පිනුම් ගැසීම, හුළං පෙති කරකැවීම, වැලි සෙල්ලම් කිරීම, කරත්ත පැදීම, දුනුවලින් විදීම වැනි කුමාර ක්‍රීඩාවල යෙදෙන බව 'මහාතණ්හාසංඛය සූත්‍රයේ' දැක්වෙයි. ක්‍රීඩාව යනු මිනිස් ඉතිහාසයේ හැම කලෙක ම ළමයින් අතර පවතින දෙයකි.

දරුවන් දෙමාපියන්ගෙන් බලාපොරොත්තු වන ආදරය කරුණාව රැකබලා ගැනීම මෙන් ම ඔවුන් ක්‍රීඩාවට යොමු කිරීම ද දෙමවුපියන් විසින් කළ යුතු ම දෙයකි.

''ආපාදකා පෝසකා, ඉමස්ස ලෝකස්ස දස්සේතාරෝ '' යනුවෙන් මවුපියන්ගේ ගුණ දැක්වෙන විශේෂණ පද කීපයක් තිබේ. දරුවන්ගේ කායික හා මානසික දියුණුව ඇති කරන, ඔවුන්ට රැකවරණය ලබා දී පෝෂණය කරන, යහපත්

පුරවැසියන් ලෙස සමාජයට ඇතුළු වීමට දරුවන්ට නිවැරදිව මඟ පෙන්වන අය දෙමවුපියෝ ය යන අදහස එහි ඇතුළත් ය. ඒ නිසා මවුපියන් ගේ වගකීම වන්නේ දරුවන් වැරදි මඟ යන අවස්ථාවල ඔවුන් නිවැරදි මඟට ගනිමින් ඔවුන් ගේ ස්වාභාවික වූ කායික මානසික හැඩගැසීමට ඉඩ දීම යි.

එහෙත් අද දෙමාපියන් ගැන සිතන විට කනගාටුවෙන් වුව ද කිවයුතු දෙයක් ඇත. ළමයින්ට ක්‍රීඩා කිරීමට තබා තමාගේ එදිනෙද කටයුතු කරගැනීමට වත් දෙමාපියෝ ඉඩ නො දෙති. පොත් බෑගය ඔසොවාගෙන යෑමට වත් කන බොන පිඟාන කෝප්පය සේදීමට වත් ඉඩ නොදෙති. අකුරට ම ළමයින් යොමු කරති. ගෙදරදී කරගෙන ඒමට දෙන වැඩ සියල්ල දෙමාපියෝ ම කර දෙති. ළමයාට කිරීමට කිසිවක් නොමැත. දෙමාපියන් අත නැටවෙන රූකඩයක් මෙන් ජීවත්වීමට ඔවුන්ට සිදු වී ඇත. ළමයින් සතුටු කිරීමට අතට මුදල් දෙති. එය නොකළ යුතු දෙයකි. අන්තිමේ දී ළමයාට ම දොස් කියති. 'අර ළමයින් නම් හැම දේම කර ගන්න දන්නවා. අපේ ළමයින්ට හැම සැප පහසු කමක් ම තිබිලා කිසිත් කර ගැනීමට බැහැ.' මෙහි වැරදි කරුවෝ කවුරු ද? දෙමාපියෝ ම නොවෙද්ද?

මේ සමාජ පරිසරය තුළ දරුවන් නොමඟ යෑමට තිබෙන ඉඩකඩ වැඩි ය. ළමයා ළඟ මුදල් තිබෙන විට එයින් වාසි ලබා ගැනීමට බොහෝ අය ඔහු හා මිතුරු වෙති. ළමයා සතුටු වෙන දේවල් කියමින් කරමින් ඔහු නරක හැසිරීම්වලට පොළඹවා ගනිති.

එම නිසා නරක හැසිරීම්වලට යොමු වීමෙන් වළක්වා ඔවුන් රටට දැයට වැඩදායක පුරවැසියන් බවට පත් කිරීම දෙමවුපියන් සතු වගකීමකි.

දෙමාපියන්ගේ ජීවිතයේ සැබෑ සතුට උදාවන්නේ ගුණවත් නැණවත් දරුවන් දැකීමෙනි.



# It was a good deed I had done...

Other than having a party and collecting presents on my birthday, I decided for an almsgiving to our nearby orphanage. My thoughts overflew with never ending happiness.

That was the day I became nine. We all, my parents and I, got together with those parent less poor children.

The entire orphanage was filled with joy. They all enjoyed the delicious lunch provided by us. Each of them thanked us for the parcel of clothes given to them along with a toy.

We sang beautiful songs while my mother played the piano.

In the late evening we said goodbye to them and returned home with great pleasure.

I think that I have made a good example for my friends by doing such a thing. I hope to carryon this practice even on my next birthday.

What a merit it would be!

**Anupam Gawrike Hettiarachchi**
Grade 4-3
Sri Dharmarakshitha Dharma Vidyalaya
Siri Mangalaramaya - Maharagama